කටුනායක සීදූව නගර සභාව.
---------------------------------

ගම්පහ දිස්ත්‍රික්කය
---------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 සැප්තැම්බර් 09 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබු අතර , සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 ජනවාරි 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 අහිතකර මතය
----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට කටුනායක සීදූව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>.

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු.</u>

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිළදී ගන්නා ලද පරිගණක තුනක වටිනාකමවූ රු.318,000 ක් රු.3,180,000 ක් ලෙස හා ඇඟිලි සලකුණු යන්ත්‍ර දෙකක වටිනාකමවූ රු.110,000 ක් රු.11,100 ක් ලෙසද ප්‍රාග්ධන ගත කිරීම හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම ගිණුම රු.2,763,100 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) හිඟහිටි වෙනත් ආදායම් ගිණුම තුලනය කිරීමේදී දෙසැම්බර් 31 දිනට හිඟහිටි ශේෂය රු.207,795 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මුදල් පදනම මත ගිණුම් තබන ආදායම් අයිතමයන් 05 ක ආදායම් ලේඛණ අනුව 2015 දෙසැම්බර් 31 දිනට හිඟයක් නොපැවතියත්, හිඟහිටි වෙනත් ආදායම් ගිණුමට අනුව එකතුව රු. 3,419,319 ක හිඟ ශේෂයක් දක්වා තිබුණි.

(ඈ) මස්කඩ බදුකුලී නිවැරදිව බිල්කල වටිනාකම බදුකුලී ලේඛණය අනුව රු.893,535 ක් වුවත්, ගිණුමෙහි රු.1,123,535 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම ආදායම රු.230,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සහකාර කම්කරු කොමසාරිස්ගේ 2015 මාර්තු 31 දිනැති ලිපියට අනුව 2004 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාලසීමාවට අදාළව සභාව විසින් ගෙවිය යුතු රු.12,363,015 ක් වූ සේවක අර්ථසාධක අරමුදලේ හිඟ දායක මුදල් හා අධිභාර වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය බැරකමක් ලෙස හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) 2015 දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතුව ඇති ව්‍යාපෘති 03 ක ණය වාරික ශේෂය වූ රු.17,755,719 ක් ගිණුම්වල දක්වා තිබුණද, අරමුදල විසින් නිකුත් කර තිබූ ණය ආපසු ගෙවීමේ උපලේඛනය අනුව එදිනට ශේෂය රු. 17,147,708 ක් වූයෙන් රු. 608,011 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි. තවද මෙම ණය ශේෂවල පොලිය රු.399,504 ක් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(උ) ඉදිරිපත් කර තිබූ ණය හිමි ලේඛණය අනුව ගණක යන්ත්‍රයක් මිළට ගැනිම සඳහා පුද්ගලික ආයතනයකට ගෙවිය යුතුව තිබූ රු.77,700 ක්, රු.777,000 වශයෙන් හා ණයගැති රු.700,300 ක් ණය හිමියන් වශයෙන් දැක්විම නිසා මුළු ණයහිමි එකතුව රු.749,300 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) 2015 දෙසැම්බර් 31 දිනට රු.843,285 ක් වූ ආයුර්වේද ඖෂධ තොග ශේෂය හා රු.6,333,572 ක් වූ පුස්තකාල පොත් ශේෂය ගිණුම් ගතකර නොතිබුණි.

(එ) 2015 වර්ෂයේ මුළු ජල ආදායම් බිල් කිරීම් රු.17,357,233 ක්වූ නමුත්, ආදායම් ගිණුමෙහි රු.22,421,422 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.5,064,189 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබූණි.

1.3.2 <u>අවිනිශ්චිත ගිණුම</u>

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කල ශේෂ පත්‍රයේ සටහන 10 යටතේ, 2014 වර්ෂයේ අවිනිශ්චිත ගිණුම වශයෙන් රු.337 ක් දක්වා තිබූ අතර, එම ආරම්භක ශේෂයට 2014 වර්ෂයේ වෙනස වශයෙන් රු.11,718,181 ක් හා 2015 වර්ෂයේ වෙනස වශයෙන් රු.592,382 ක් එකතු කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය තව දුරටත් රු.12,310,900 ක් දක්වා වැඩිවී තිබුණි. ලෙජරය අනුව වූ මෙම අවිනිශ්චිත ශේෂය, ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන තුලින් හෙලිදරව් කර නොතිබු අතර, මෙම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට 2016 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු.6,363,425 ක එකතු කල අගය මත ගෙවිය යුතු බදු ශේෂයක් සාවද්‍ය ලෙස ගිණුමේ දක්වා තිබුණද,එම වටිනාකම ගිණුම්වලින් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබු අතර , ව්‍යාපාර වර්ග 03 කට අදාළව ආයතන 06 කින් සමාලෝචිත වර්ෂය සඳහා රු.93,925 ක් වූ බලපත්‍ර ගාස්තු ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ආදායම් ගිණුම් විෂයයන් 17 ක ගිණුමේ ශේෂ හා ලේඛණ/උපලේඛණ අතර ශේෂවල රු.71,754,819 ක වෙනස්කම් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමක් පිළියෙල කර නොතිබුණි.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

එකතුව රු.45,390,985 ක් වූ ගිණුම් විෂයයන් 09 ක ගණුදෙනු සඳහා විස්තරාත්මක උපලේඛණ/තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 නීති,රීති රෙගුලාසි විධිවිධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් පාලන කොමසාරිස්ගේ 1988 අප්‍රේල් 20 දිනැති අංක. 88/20 දරන චක්‍රලේඛය ප්‍රකාර රු.10,066,575 ක ස්ථාවර තැන්පතු 02 ක් මුදල් කරගැනීමේදී පළාත් පාලන කොමසාරිස්ගෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 135 ප්‍රකාර මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීමක් සිදුකර නොතිබු අතර 139(10) ප්‍රකාර චෙක්පත් මගින් ගෙවීම් සිදු කිරිමේදී බැංකු ශේෂය සියලුම ගෙවීම් පියවා ගැනීමට ප්‍රමාණවත් බව තහවුරු කරගත යුතු වුවද, එසේ නොකිරීම නිසා 2015 නොවැම්බර් 30 දිනට මහජන බැංකු මුදල් පොත අනුව රු. 4,183,109 ක අයිරා ශේෂයක් විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.18,109,878 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායමට වඩා වැඩිවූ වියදම රු.41,139,611 ක් විය.

2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රශස්ථ ජංගම අනුපාතය 2:1 වශයෙන් තිබිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ එම අනුපාතයන් පිළිවෙලින් 1.77: 1 ක් හා 0.92:1 ක් වූ හෙයින් නගර සභාවේ ද්‍රවශීලතාවය ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම් පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|
| | ----------------- | ------------------- | ------------- | -------------------------- |
| | | '000 | '000 | '000 |
| | | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 108,572 | 110,874 | 83,385 |
| (ii) | බදුකුලී | 7,433 | 10,864 | 3,298 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,084 | 2,502 | 100 |
| (iv) | වෙනත් ආදායම් | 48,031 | 40,890 | 3,474 |

2.3.2 වරිපනම් බදු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වරිපනම් බදු අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතුණු අතර 2015 වර්ෂයේ අවසානයට පැවති හිඟ ශේෂයෙන් 2016 නොවැම්බර් වන විට අයකර තිබුණේ සියයට 45 ක් හෙවත් රු.37,319,669 ක් පමණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු ලේඛණය හා ගිණුම අතර රු.17,514,599 ක වෙනසක් පවතිද්දී, ඒ පිළිබඳව විධිමත් පරීක්ෂාවකින් තොරව 2016 වර්ෂයේදී වරිපනම් ලේඛණ භාවිතය සම්පූර්ණයෙන් ඉවත්කර පරිගණක පැකේජයක් සඳහා යොමුවී තිබුණි.

2.3.3 කඩකුලී

බදුදී ඇති සීදූව නව වෙළඳ සංකීර්ණයේ කඩකාමර 18 කට අදාළව 2009 දෙසැම්බර් 09 දිනැති රජයේ තක්සේරුකරුගේ තක්සේරු වටිනාකමින් සියයට 50 පමණක් අයකර තිබූ අතර 2014 වර්ෂය වන විට එම තක්සේරුවට වර්ෂ 05 ක් ඉක්ම ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයේදීද එම මුදලම අය කර තිබුණි.

2.3.4 වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු

නගර සභා බලප්‍රදේශයේ තිබෙන ප්‍රසිද්ධ නිමි ඇඳුම් (ඇඟලුම්) නිෂ්පාදන ආයතනයකින් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපාර බදු මුදල අයකර නොතිබූ අතර, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ ලියාපදිංචි කර තිබූ හෝටල්, ලැගුම්හල් 07 කින් සමාලෝචිත වර්ෂයට බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

2.4 බැංකු ගිණුම්

(i) 2014 දෙසැම්බර් බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව 2014 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය රු.23,631,773ක් ලෙස දැක්වූවද, 2015 ජනවාරි බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව 2015 ජනවාරි 01 දිනට මුදල් පොතේ ශේෂය රු.23,632,608 ක් ලෙස දක්වා තිබුණි.

(ii) මුදල් පොතේ සටහන් නොකල කෙලින්ම බැංකුවට ලැබී තිබූ ප්‍රේෂණ රු.2,971,687 ක් බැංකුව වැඩියෙන් තැන්පත් කිරීම් රු.5,723 ක් හා බැංකුව අඩුවෙන් තැන්පත් කිරීම් රු. 67,431 ක් හඳුනාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2015 පෙබරවාරි හා නොවැම්බර් මාසයන්හි බැංකු සැසඳුම් ප්‍රකාශයන්ට අනුව එම මාසයන්ට අදාල ගෙවීම් ලෙස පිළිවෙලින් රු.27,760,608 ක් හා රු.20,900,090 ක් වශයෙන් දක්වා තිබුණද, ගෙවීම් මුදල් පොතට අනුව එම මාසයන්හි ගෙවීම්වල එකතුව පිළිවෙලින් රු.26,752,971 ක් හා රු. 20,896,500 ක් විය.

2.5 <u>හඳුනාගත් පාඩු</u>

වැසි ජල අපවහන ව්‍යාපෘතිය හා පුස්තකාල ව්‍යාපෘතිය සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් පිළිවෙලින් ලබාගෙන තිබූ රු.8,332,123 ක් හා රු.18,058,218 ක ණය මුදල්වලට අදාලව ගෙවිය යුතු වාරික හා පොලී මුදල් 2014 වර්ෂය දක්වා නිසි පරිදි ගෙවීම් කිරීමට නොහැකි වීමෙන් 2015 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.71,219 ක් හා රු.229,941 ක් ප්‍රමාද ගාස්තු වශයෙන් ගෙවීමට සිදුවී තිබුණි.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දැනට ක්‍රියාත්මක නොවන ළිං 03 ක් සඳහා නිශ්කාර්ය පරිදි සේවකයන් 06 දෙනෙකු මුරසේවය සඳහා අනුයුක්ත කර සමාලෝචිත වර්ෂයේදී රු.1,568,886 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ හා කරත්ත ගිණුමේ දැක්වෙන අයිතම 12කට අයත් වටිනාකම වූ රු.636,595 ක් වූ භාණ්ඩ 61 ක් භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත්ව තිබූ අතර, එම වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

3.2 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) අංක.11801,11851,11901 සහ 11951 දරන මිශ්‍ර ආදායම් කුවිතාන්සි පොත් අස්ථානගතවී ඇති බව අනාවරණය වී තිබූ නමුත්, එම අස්ථාන ගතවූ බිල්පොත් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් කළමනාකරණය විසින් ගෙන නොතිබුණි.

(ආ) 2015 වර්ෂයට අදාළව සභාවේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් අයිතමයන් 07 ක් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක වී නොතිබුණි.

3.3 සන අපද්‍රව්‍ය කළමනාකරණය

සීදූව අම්බලන්මුල්ල කසල අංගනයේ කසල තුනී කිරීම.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) මෙහි කසල තුනී කිරීම සඳහා 2014 ඔක්තෝබර් 01 දින සිට 2015 සැප්තැම්බර් 30 දින දක්වා මසකට රු.168,000 බැගින් ගිවිසුම් ගතවීම සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර කොන්ත්‍රාත්කරුවෙකු තෝරා නොගෙන පළමු කොන්ත්‍රාත්කරු වෙතම පවරා තිබුණි.

(ii) කසල බැහැර කරන භූමිය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබූ අතර, කසල අංගනය වෙත ගෙනඑනු ලබන කසල ප්‍රමාණය වාර්තා කිරීම සඳහා වාර්තා හා ලේඛණ පවත්වා නොතිබුණි. කසල තුනී කරන යන්ත්‍රයක් අලුත්වැඩියාවන් සඳහා යොමු කිරීමේදී ඒ දිනයන්වල දෛනික කසල තුනීකිරීම සම්බන්ධව ප්‍රතිපාදන ගිවිසුමේ අන්තර්ගතව නොතිබුණි.

(iii) ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කසල අංගනය වෙත ලැබෙන කසල ට්‍රැක්ටර් 30 ක ප්‍රමාණය දිනපතා තුනීකර කසල අංගනය යථා තත්ත්වයට පවත්වාගෙන යාම සිදුකල යුතු වුවත්, 2015 ඔක්තෝබර් 08 දින කරන ලද විගණන පරීක්ෂාවේදී කසල තුනී කිරීම නිසි පරිදි සිදුව නොමැති බවත් කසල තුනී කර පස්දමා නොතිබූ බවත් අනාවරණය විය.

3.4 කොන්ත්‍රාත් පාලනය

3.4.1 රොබින් ප්‍රනාන්දු මාවත තාර දමා සංවර්ධනය කිරීම.

රොබින් ප්‍රනාන්දු මාවත තාර දැමීම සඳහා රු.1,709,199 ක මුදලකට 2014 අප්‍රේල් 03 දින ගිවිසුම් අත්සන් කර තිබූ අතර, සභාවේ මූල්‍ය තත්ත්වය අයහපත් වීම හේතුවෙන් මාස 08 ක් ප්‍රමාද වී වැඩ ආරම්භ කිරීමට යාමේදී මාර්ගයේ වලවල් සෑදීම නිසා මුල් ඇස්තමේන්තුවට අතිරේකව බොරළු කියුබ් 27 ක් යෙදවීම වෙනුවෙන් රු. 90,364 ක් ගෙවා තිබුණි.

3.4.2 ලියනගේමුල්ල ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයක් හා නගර සභාව අතර ඉඩම් හුවමාරුව

දේපල සමාගමක් විසින් ලියනගේමුල්ල ග්‍රාමයේ වෙන්දේසි කරන ලද ඉඩමෙන් පොදු කටයුතු සඳහා නීත්‍යානුකූලව සභාවට ලැබී තිබූ ලොට් 15 දරන පර්චස් 30 ක ඉඩම් කොටස නිසි කලට අත්පත් කර නොගැනීම හේතුවෙන් පෞද්ගලික ආයතනය මෙම ඉඩම් කොටස පරිහරණය කර ඉඩම වටා තාප්පයක් ඉදිකර තිබුණි. 2012 ඔක්තෝබර් 30 දිනැති මාසික සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණය පරිදි යෝජිත පර්චස් 30 ක බිම් කොටසින් පර්චස් 15 ක කොටසට වර්තමාන වෙළඳපල වටිනාකම ලබාගෙන ඉතිරි පර්චස් 15 ක කොටසෙහි බහු කාර්ය ගොඩනැගිල්ලක් හා ළමා උද්‍යානයක් පෞද්ගලික ආයතනය විසින් ඉදිකර දිය යුතු වුවද, එම කාර්යය ඉටුනොකර මුළු බිම් කොටසටම රු.3,000,000 ක මුදලක් 2015 සැප්තැම්බර් 11 දින ලබාගෙන තිබුණි. 2013 අගෝස්තු 08 දින රු.3,000,000 කට කල තක්සේරුවට අදාල මුදල 2015 සැප්තැම්බර් 11 දින ලැබී තිබූ හෙයින්, සභාවට විශාල මූල්‍ය පාඩුවක් සිදුව තිබුණි.

3.4.3 සභාව සතු ට්‍රැක්ටරයක් අලුත්වැඩියා කිරීම

සභාව සතු ට්‍රැක්ටරයක් 2012 පෙබරවාරි 02 දින පෞද්ගලික ආයතනයකට අලුත්වැඩියාව භාරදී තිබූ අතර, එම ආයතනය විසින් රු.670,406 කට ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබූ අතර, සභාව එම මුදලට අලුත්වැඩියා කිරීමට එකඟතාවය දක්වා නොතිබුණි. යාන්ත්‍රික ඉංජිනේරුගේ මතය වී තිබුනේ ඇස්තමේන්තු අගය විශාල මුදලක් බැවින් රු.780,000 ක් වූ මෙම ට්‍රැක්ටරය අපහරණය කිරීම සුදුසු බව

වුවද, 2016 ඔක්තෝබර් 04 දිනවන විටත් ට්‍රැක්ටරය සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. අළුත්වැඩියා කරන ආයතනය විසින් 2015 නොවැම්බර් 11 දින එවා තිබූ එන්තරවාසිය අනුව වසර 03 මාස 07 දින 15 ක් සඳහා දිනකට රු.100 බැගින් ගෙවා ට්‍රැක්ටරය රැගෙන යන ලෙස දන්වා තිබුණි. දැනට මෙම ගරාජය පෙර පැවති ස්ථානයේ නොමැති බවද විගණනයේදී වැඩිදුරටත් අනාවරණය විය.

4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) අයවැය පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය

(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය